ජාඇල නගර සභාව - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාඇල නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට ජාඇල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු

කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ** වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1. පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රමිතියේ 2 වන පරිච්ඡේදයේ 2.5 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු වුවත්, පෙර වර්ෂයන් සඳහා සමාලෝචිත වර්ෂය තුල දී ලැබී තිබුණු මුද්දර ගාස්තු වටිනාකම රු.52,013,639 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.	ඉදිරියේදී උපචිත පදනම මත ගිණුම් තැබීමට කටයුතු කරන බව.	උපචිත පදනම මත ගිණුම් තැබීම කළ යුතුය.
(ආ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.6 ඡේදයට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පෙර වර්ෂයේ සංසන්දනාත්මක ශේෂයන් වෙනුවට 2022 වර්ෂයේ ශේෂයන් සටහන් කර තිබුණි.	නිවැරදි කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශය මේ සමග ඉදිරිපත් කරන බව.	ප්‍රමිතියට අනුව සංසන්දනාත්මක ශේෂයන් දැක්වීමට කටයුතු කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ගේට්ටු සවිකිරීම් සඳහා දරන ලද රු.1,482,020 ක වියදම ගොඩනැගිලි හා සවිකිරීම් යටතේ ගිවිසුම්ගත කළ යුතු වුවත් ඉඩම් ගිණුමට ප්‍රාග්ධනිත කර තිබුණි.	2025 වර්ෂයේ සවි කිරීම් ගිණුමට හර හා ඉඩම් ගිණුමට බැර වශයෙන් රු.1,482,020 ක මුදලක් ගිණුම් ගත කරන ලද බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම් සිදු කළ යුතුය.
(ආ)	නගර සභා කාර්යාල පරිශ්‍රයේ රථවාහන අංගනය ඉදිරිපස මිදුල කාපට් කිරීම වෙනුවෙන් දරන ලද රු.2,233,472 ක වියදම කෙරීගෙන යන ඉඩම් යටතේ ගිණුම්ගත කර තිබුණි.	2025 වර්ෂයේ ගිණුම් සකස්කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම් සිදු කළ යුතුය.

1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ගිණුම් ශේෂ 04 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපලේඛන අනුව ශේෂය අතර රු.7,532,408 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	මෙයට හේතුව ජර්නල් සටහන ශේෂ පිරික්සුමට ගැලපීමට අතපසු වීම බව	උපලේඛන යාවත්කාලීනව පවත්වා ගනිමින් ඒවා පදනම්ව ගිණුම් නිවැරදි කළ යුතුය.

1.7. අනුකූල නොවීම්

1.7.1. නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නගර සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබද රීති 333	පිළිගත හැකි හේතුවක් නොමැතිව ටෙන්ඩර් කාර්යය සඳහා වූ ටෙන්ඩර් කමිටුවක හෝ ඇගයීම් කමිටුවක සාමාජිකයකයින් අනුගාමී රැස්වීම් 3 කට සහභාගී නොවූ නිලධාරීන් සම්බන්ධයෙන් එම විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	සභාව වෙත හා පළාත් පාලන කොමසාරිස් වෙත දැනුම්දීමට ඉදිරියේදී කටයුතු කරන බව.	මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති අනුව කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
i.	189	වටිනාකම රු.71,608 ක් වූ වරිපනම් ගෙවීම සඳහා ලබාදී තිබුණු අගරු චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.	අහරු චෙක්පත් හිමියන් දැනුවත් කර ඇති බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.
ii.	571	වර්ෂ 02 ඉක්මවූ තැන්පතු වර්ග 04 ක තැන්පතු 118 ක් නියාදනය කර නොතිබුණි.	2025 වර්ෂය තුළදී තැන්පත් නියාදනය කිරීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය
(ඇ)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ			
	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන	වාහන ලොග් පොත් පිළිබඳ නියැදි විගණන පරීක්ෂාවේදී සභාව සතු වාහන 26 ක් සඳහා ඉන්ධන දහන	මේ වන විට මයිලෝ මීටර ක්‍රියාත්මක වාහන සඳහා ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමේ	චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය.

	චක්‍රලේඛයේ 3.1 ජේදය	පරීක්ෂාව වසර 5 ත් 10 ත් අතර කාලයක සිට සිදුකර නොතිබුණි.	කටයුතු ආරම්භ කර ඇති බව.	
(ඇ)	නගර සභා ආඥා පනතේ 153 හා 157 (II) වගන්තිය	පොදු සහ පෞද්ගලික වෙළඳපොළවල් සහ පොළවල් නඩත්තු කිරීම, ගාස්තු අය කිරීම, වෙන්කර දීම සඳහා වූ අතුරු ව්‍යවස්ථා සෑදිය හැකි වුවත් සභාව සතු කඩකාමර බදු දීම විධිමත් කිරීම හා නියාමනය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පිළියෙල කර නොතිබුණි.	කඩ කාමර බදු දීම විධිමත් කිරීම හා නියාමනය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පිළියෙල කිරීමට කඩිනමින් කටයුතු කරන බව.	අතුරු ව්‍යවස්ථා සකස් කර සභාවේ කටයුතු විධිමත් කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.31,596,151 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු.142,785,007 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ආදායම් ප්‍රභවය	2024				2023			
	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැ.31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැ.31 දිනට මුළු හිඟය
	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000
වරිපනම් හා බදු	48,212	43,051	42,210	40,122	49,802	48,635	56,599	38,748
කුලී	19,028	18,013	21,879	6,089	19,607	20,487	23,936	10,032
බලපත්‍ර ගාස්තු	1,820	1,371	1,361	-	3,203	1,247	1,249	5
වෙනත් ආදායම්	118,396	93,312	88,984	159	117,104	132,480	103,806	50
	187,456	155,747	154,434	46,370	189,716	202,849	185,590	48,835

2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**වරිපනම් හා බදු**		
(i)	සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මුළු වරිපනම් හා බදු හිඟ වටිනාකම රු.මිලියන 40.12 ක් විය. 2014 වර්ෂයට පෙර සිට පැවත එන ජා-ඇල තානායමට අදාලව වරිපනම් ඒකක 05 කින් රු.15,216 ක් හිඟ හිටව පැවති අතර, 2014 වර්ෂයේදී නව ගොඩනැගිල්ලක් ඉදිකර මෙම තානායම පවත්වාගෙන යන නමුත් ඒ සඳහා වරිපනම් අංකයක් ලබාදී නව වරිපනම් තක්සේරුවක් ද සිදුකර නොතිබුණි.	ජාඇල තානායමේ අයිතිය පිලිබඳව නාගරික සංවර්ධන අධිකාරිය හා ජාඇල නගර සභාව නඩුවක් පවතින නිසා නීතිඥ උපදෙස්මත බදු පැනවීමෙන් වැලකී සිටීමට සිදුවී ඇති බව.	හිඟ ආදායම් අය කර ගැනීමටත් වත්කම් වලින් ආදායම් අයකර ගැනීමටත් වත්කම්වල අයිතිය නිරවුල් කර වරිපනම් අය කර ගැනීමටත් ක්‍රියා කළ යුතුය.
(ii)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 40.122 ක ශේෂයෙන් වසර 3 ත් 5 ත් අතර රු. 8,750,638 ක්ද, වසර 5 ත් 10 ත් අතර රු. 4,902,922 ක්ද වසර 10 ට වැඩි රු. 15,120,408 ක් ද හිඟ වරිපනම් වී තිබුණි. මෙම හිඟ ශේෂ අය කර ගැනීම සම්බන්ධව නගර සභාවේ අවධානය යොමු වී නොතිබුණි.	ස්ථාන පරීක්ෂාවක් සිදුකර වංචල දේපළ තහනම් කර හිඟ බදු මුදල් අයකිරීමට කඩිනමින් කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීම සහ ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කිරීම කළ යුතුය.
(iii)	සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත විනෝද බදු වටිනාකම රු.4,400,000 ක් වුවද බිල්කළ වටිනාකම රු.2,348,771 ක් වී තිබුණු අතර, බිල් කළ ආදායමෙන් රු.888,677 ක් අයකර ගැනීමට කටයුතු කළ නොතිබුණි.	2024 වර්ෂයේදී විස්ටා සිනමාශාලාව කඩා ඉවත්කර ඇති අතර සිනමැක්ස් සිනමා ශාලාවේ හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	කුලී		
	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වෙළඳ ස්ථාන කුලී 1 යටතේ රු.1,470,011 ක හිඟ කුලියක් ද වෙළඳ ස්ථාන කුලී 2 යටතේ රු.4,517,081 ක හිඟ කුලියක්ද අයකර ගැනීමට පැවතුණි.	මෙම තානායමේ අයිතිය පිලිබඳව නාගරික සංවර්ධන අධිකාරිය හා ජාඇල නගර සභාව අතර නඩුවක් පවතින බැවින් නීතිඥ උපදෙස්මත කුලී	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

	අයකිරීමෙන් වැලකී සිටීමට සිදුවී ඇති බව.	

(ඇ) **බලපත්‍ර ගාස්තු**

2014 වර්ෂයේ සිට ජා ඇල තානායම පවත්වා ගෙන ගියද ඒ සඳහා වෙළඳ බලපත්‍රයක් නිකුත් කර නොතිබුණි.	මෙම තානායමේ අයිතිය පිලිබඳව නාගරික සංවර්ධන අධිකාරිය හා ජාඇල නගර සභාව අතර නඩුවක් පවතින බැවින් නීතිඥ උපදෙස්මත බදු පැනවීමෙන් වැලකී සිටීමට සිදුවී ඇති බව.	ව්‍යාපාරය පවත්වාගෙන යෑම සඳහා වෙළඳ බලපත්‍රයක් නිකුත් කළ යුතුය.

(ඇ) **වෙනත් ආදායම්**

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත වෙනත් ආදායම රු. 118,396,000 ක් වුවත් බිල්කළ වටිනාකම රු. 93,312,000 ක් වූයෙන් ඇස්තමේන්තු වටිනාකමින් බිල් නොකළ වටිනාකම රු. 25,084,000 ක් තරම් ඉහල අගයක් ගෙන තිබුණි.	ස්ථාවර තැන්පතු පොළී ප්‍රතිශතය අඩුවීමත් කොම්පෝස්ට් අංගනයේ වැඩ කටයුතු අඩපණ වීමත්, වරිපනම් හිඟ එකතු කිරීමේ දුර්වල තත්ත්වය මත වරෙන්තු ගාස්තු හා දඩ අයකිරීම් අඩු වීමත් ඊට බලපා තිබුණු බව.	ඇස්තමේන්තු නිවැරදිව සකස් කළ යුතුය.

(ඉ) **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතු 2022 වර්ෂයේ ඔක්තෝම්බර් හා නොවැම්බර් මාස වලට අදාළව උසාවි දඩ මුදල්ද 2023 වර්ෂයේ මැයි මාසයට හා ජූලි සිට දෙසැම්බර් දක්වා මාසවලට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායමද අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මේ වන විට උපලේඛන සකස් කරමින් පවතින බව.	හිඟ මුදල් නොපමාව අය කර ගෙන ඵලදායීව උපයෝජනයට ක්‍රියා කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022 වර්ෂයේ ස්ථාපිත කරන ලද රු.655,000 ක් වූ තොග හා ගබඩා කළමනාකරණ මෘදුකාංගය සහ රු.865,000 ක් වූ වැටුප් කළමනාකරණ මෘදුකාංගය 2025 මාර්තු මාසය වන විටත් ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුනු බැවින්	සේවක ණය හා පෞද්ගලික ලිපිගොනු විෂයන්ට අදාල මෘදුකාංග පද්ධතිය හා වැටුප් කළමනාකරණ මෘදුකාංග පද්ධතිය කඩිනමින් යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව.	මහජන මුදල් උපරිම කාර්යක්ෂමව උපයෝජය කිරීමට ක්‍රියා කළ යුතුය.

	මෙම වියදම් නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.		
(ආ)	සභාව සතු ආදාහනාගාරය සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.	බලපත්‍රය ලබා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව.	පරිසර බලපත්‍රයක් ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය.

3.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	ශාන්ත මරියා පාරේ බදු දෙන ලද කඩ කාමර 22 න් කඩ කාමර 14 ක් සඳහා බදුකරුවන් සමඟ බදු ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණු අතර, කඩ කාමර 3 ක හිඟ කඩ කුලී අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉතිරි හිඟ මුදල්ද කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව.	කඩ කාමර බදු දීමේදී විධිමත් ගිවිසුමකට එළඹීමත්, හිඟ කුලී ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ආ)	සභාව විසින් 1986 වර්ෂයේ දී ගිවිසුමකින් තොරව ලබා දී තිබූ කොළඹ පාර සුළු ව්‍යාපාර අංක 01 කඩ කාමරයේ බදුගැණුම්කරු විසින් අතුරුබදු දී තිබූ අතර, සභාව විසින් 2008 වර්ෂයේ අතුරු බදුකරු සමග ගිවිසුම්ගත වී තිබුණි. නමුත් ගිවිසුම අවලංගු වන කාලපරිච්ජේදයක් හෝ මාසික බදු කුළී මුදලක් ගිවිසුමේ සඳහන් කර නොතිබුණි. තවද නගර සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ රීති අංක 408 (iii) අනුව මාසික කුලී තක්සේරුව 2023 වර්ෂයෙන් පසුව ලබා ගෙන නොතිබුණි.	මෙම කඩ කාමර සඳහා නව තක්සේරුවක් ලබාදෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා සිහි කැඳවීම්ද සිදු කර ඇති බව.	කඩ කාමර බදු දීමේදී විධිමත් ගිවිසුමකට එළඹීමක් කාලීනව කුලී තක්සේරුව සිදු කිරීමටත් කටයුතු කළ යුතුය.
(ඇ)	නගර සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ රිති 408 (iii) අනුව කුලියට දෙනු ලබන සෑම නිශ්චල දේපළකටම අදාළව ගිවිසුම් දිනෙන් සෑම වසර 03 කට වරක් මාසික කුලිය තක්සේරු කළ යුතු වුවත් , දුම්රියපළ පාර කඩකාමර 23 සඳහා නව තක්සේරුවක් සිදු නොකර මුල් කුලී මුදලටම නැවත බදු දීම් සිදුකර තිබුණි.	මෙම කඩ කාමර සඳහා නව තක්සේරුවක් ලබාදෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා සිහි කැඳවීම්ද සිදු කර ඇති බව.	මූල්‍ය රීති අනුව වර්ෂ 3 කට වරක් නව තක්සේරුවක් සිදු කරවා ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ)	පොදු වෙළඳපළ අසල සුළු ව්‍යාපාර ස්ථාන සඳහා වූ කඩකාමර අතරින් කඩකාමර 08 ක් සම්බන්ධයෙන් ලේඛනගත බදුකරුගේ නම හැර බදු ගිවිසුම හෝ ගිවිසගත් කාල පරිච්ඡේදයක් සම්බන්ධ විස්තර සභාව සතුව නොතිබුණු අතර, කඩකාමර 09 කින් 2024 දෙසම්බර් 31 දින වන විට මාස 02 සිට මාස 24 දක්වා රු. 406,767 ක කඩ කුලී හිඟව පැවතුණි.	හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව.	බදු ගිවිසුම් යාවත්කාලීනව පවත්වාගෙන යෑමටත් හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඉ)	ලේක් සිටි ඉඩම අනුබෙදීමෙන් දේපල වෙන්දේසිකරුට අලෙවි කළ නොහැකි කොටස් වන අක්කර 01 රූඩ් 03 පර්චස් 0.26 ක වැවක් හා කැබලි කිරීමෙන් අනතුරුව ශේෂ වුන ත්‍රිකෝණාකාර වැනි කොටසක් පොදු කටයුතු සඳහා සභාව වෙත පවරා තිබුණි. සභාව විසින් මෙම ඉඩම් කොටස නිශ්චිතව හඳුනා ගෙන නොතිබුණි.	වැව මගින් එම නිවාස සංකීර්ණයේ පදිංචිකරුවන්ට ගංවතුර අවදානමක් සිදුවීම වැලකී ඇති බව.	වෙන්දේසි ඉඩම් සම්බන්ධව 1986 මාර්තු 10 දිනැති අංක 392/9 දරන ගැසට්පත්‍රය අනුව කටයුතු කළ යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව ලබා දෙන ලද ලේඛනය අනුව ඔප්පු අංක 8201 යටතේ අක්කර 01 රූඩ් 01පර්චස් 36.4 ක තුඩැල්ල නවසිගහවත්ත ඉඩම පිළිබඳ භෞතික පරීක්ෂාවේදී එම ඉඩම් කොටසේ නිවාස 12 ක් ඉදිකර තිබුණ ද ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දීමක් සිදු කර නොතිබුණි.	මෙම නිවාස ඉදි කිරීම සඳහා නගර සභාවේ අනුමැතිය ලබාදී නොමැති බව.	අනවසර ඉදි කිරීම් පාලනය කිරීමට වැඩපිළිවෙලක් ස්ථාපිත කළ යුතුය.
(ආ)	2015 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු Legal ප්‍රමාණයේ කඩදාසි බන්ඩල් 151 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගබඩාවේ නිශ්කාර්යව පැවතුණි.	සභා භූමියේ ඉදි වෙමින් පවතින අළුත් ගොඩනැගිල්ල නිමවූ පසුව සියළුම ගබඩා භාණ්ඩවල ආරක්ෂාව සහතික කිරීමට කටයුතු කරන බව.	අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන මිලදීගැනීම් සිදු කිරීම හා තොග ආරක්ෂිතව පවත්වාගෙන යෑමට කටයුතු කළ යුතුය.
(ඇ)	විශ්‍රාම ගිය, සේවය හැරගිය, මාරුවීම් ලබා ගිය කාර්යාල නිලධාරීන් 27 දෙනෙකු විසින් පුස්තකාල පොත් 57 ක් ලබාගෙන ආපසු භාරදී නොතිබුණි.	එම පොත්වල වටිනාකම ඔවුන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන බව.	පොත් නැවත ලබාගැනීමට කටයුතු කළ යුතුයි.

(ඈ)	රු.363,268 ක් වටිනාකමැති පුස්තකාල පොත් විනාශ කිරීමට නිර්දේශ කර එහි වටිනාකම ගිණුම්වලින් ඉවත්කර තිබුණද 2025 මාර්තු 05 දින වන විටත් පුස්තකාලයේ පැවතුණි.	පරිග්‍රහන ලේඛනයෙන් එම වටිනාකම ඉවත් කිරීමට කටයුතු කරන බව.	සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

3.4 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
සභාවේ තනතුරු 12 කට අදාලව කාර්යමණ්ඩලයේ නිලධාරීන් 27 ක් පුරප්පාඩුව පැවතිණි.	එම පුරප්පාඩු සම්බන්ධව කාර්තු වාර්තා මගින් හා ලිඛිතව පළාත් පාලන කොමසාරිස් (බ.ප) වෙත දැනුවත් කර ඇති බව.	පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය.